# 01 අසිරිමත් බෝසත් කුමරු

එදා පෝය නිවාඩු දිනයකි. බෝසත් ළමා සමාජයේ දරුවෝ විහාරස්ථානයට පැමිණ සිල් සමාදන් වූ පිරිසට ගිලන්පස පිළිගැන්වූහ. පසු ව ඔවුහු පොඩි හාමුදුරුවන් හමු වීමට කතිකා කර ගත්හ. පොඩි හාමුදුරුවෝ සංඝාවාසයේ ආලින්දයේ වැඩ හිඳ බණ පොතක් කියවමින් සිටියහ."අප මහ බෝසතාණන් වහන්සේ වෙසතුරු අත් බවින් නික්ම තුසිත දෙව්ලොව අපමණ දෙව්සිරි විඳිමින් සිටිසේක. එකල **බුද්ධ කෝලාහලය** නම් කෝලාහලයක් ඇති විය" යැයි පොඩි හාමුදුරුවෝ බණ පොත කීම නතර කළහ. දරුවෝ එතැනට ගොස් වැඳ අවසර ගෙන බිම වාඩි වූහ. ශාන්ත මෙසේ විමසී ය.

''අවසරයි පොඩි හාමුදුරුවනේ, මොකක් ද **බුද්ධ කෝලාහලය** කියන්නේ...?''

''ලෝකයෙහි දෙවියන් බුදු කෙනෙකු උපදින්නට අවුරුදු දහසකට පෙර **මෙයින් අවුරුදු දහසක් ඉකුත් වූ කල බුදු කෙනෙකුන් උපදිනවා යි** හඬ නගා කියමින් ඇවිදිනවා. අන්න ඒකට තමයි, බුද්ධ කෝලාහලය කියන්නේ...''



"පොඩි හාමුදුරුවනේ බුදු කෙනෙක් පහළ වුණේ කොහොම ද කියලා කියා දෙන්නකෝ." කුමුදුනී ආරාධනා කළා ය.

''මේ බුද්ධ කෝලාහලය මිනිසුන්ට මෙන් ම දෙවියන්ට හා බඹුන්ටත් ඇහෙනවා. ඒ ඇහුණා ම දහසක් සක්වල දෙවියන් බඹුන් මේ මඟුල් සක්වලට ම රැස් වෙනවා.

එසේ රැස් වූ දෙවි බඹුන් අසවල් නම් ඇති කෙනෙකු බුදු වෙනවා යි දැන ගන්නවා. දැනගෙන ඒ වන විට තුසිත දෙව්ලොව වැඩ සිටින බෝසතුන් වෙත ගොස් ආරාධනා කරනවා. දේවාරාධනාව යනු එයයි.''

"ලෝ සතුන් සසර දුකින් මුදවනු පිණිස ඔබ වහන්සේ බුදුබව ප්‍රාර්ථනා කරමින් දස පාරමී දම් පිරුවා. දැන් ඒ පාරමී දම් පුරා අවසානයි. බුදු වන්නට කාලය පැමිණ ඇතැ"යි සහම්පති මහා බ්‍රහ්මයා ප්‍රමුඛ දෙවියන් බඹුන් මෙසේ ආරාධනය කළත්, බෝසතාණන් ඔවුන්ට පොරොන්දුවක් නොදී **පස් මහ බැලුම්** නම් වූ පංච මහා විලෝකනය කළා. එනම් බුදු වීමට සුදුසු කාලය, දීපය, දේශය, කුලය හා මවු යන මේ කරුණු පහ ගැන විමසා බැලීමයි. මෙසේ පස් මහ බැලුම් බැලූ බෝසතාණන් මිනිස් ලොව උපදින්නට තීරණය කළා.



එදා මුළු දඹදිව් තලය ම සැණකෙළි පැවැත්වූ දිනයක්. මහාමායා දේවියත්, සුද්ධෝදන රජතුමාත් ඊට සහභාගි වුණා. ඇසළ පෝය දා මහාමායා දේවිය පෙහෙවස් සමාදන් වී දුගී මඟී යාචකාදීන්ට දන් දෙමින් කල්ගත කළා. එදින මැදියම් රැයේ දී ඇය පුදුම උපදවන සිහිනයක් දුටුවා. සුදු ඇත් පැටවෙකු සුදු පියුමක් සොඬින් ගෙන, තමා නිදා සිටින යහන වටා තෙවරක් පැදකුණු කොට තමන්ගේ කුසට ඇතුළු වීම ඒ සිහිනය යි.

සුදොවුන් රජුට සිහිනය දැන්වූ විට ඒ ගැන උගත් බමුණු පඬිවරුන්ගෙන් විමසුවා. එවිට ඔවුන් ප්‍රකාශ කළේ පින්වත් කුමරකු දේවියගේ කුස පිළිසිඳ ගෙන ඇති බවයි. එබැවින් සුදොවුන් රජතුමා ඇතුළු රජ මාලිගයේ පිරිස මහාමායා දේවිය හොඳින් රැකබලා ගැනීමට කටයුතු කළා.

දස මසක් ඉක්ම ගිය ද වෙසක් පුර පසළොස්වක දිනය එළඹුණා. සුද්ධෝදන රජතුමාගෙන් අවසර ගත් මහාමායා දේවිය ඇතුළු පිරිස අලංකාර පෙරහැරකින් තම මවුපියන් ජීවත් වන **දෙව්දහ** නුවර බලා යාමට පිටත් වුණා.

මහාමායා දේවිය අතර මඟ මලින් පිරුණු **ලුම්බිණි** නම් සල් උයන දැක එහි මඳක් නැවතී යන්නට කල්පනා කළා. එහි මලින් බර වුණ අලංකාර සල් ගසක් දුටු ඇය එහි අත්තක් අල්ලා ගත්තා. ඒ වේලාවේ දී එතුමියගේ ගතට අමුත්තක් දැනුණා. ඒ බව තම සේවිකාවන්ට දැනුම් දුන් විට ඔවුන් දේවිය වටා තිර ඇද රැකවල් දැම්මා. මොහොතකින් අප මහා බෝසතාණන් වහන්සේ මවු කුසින් බිහි වුණා.



ඒ මොහොතේ සතරවරම් දෙවිවරුන් සාධුකාර පැවැත්තුවා. අහසින් සිසිල් හා උණුසුම් දිය දහරා දෙකක් මතු වුණා. මෙවැනි අසිරිමත් සිදුවීම් සමගින් ම පොළොවෙන් මතු වූ නෙළුම් මල් මත පුංචි කුමරු පියවර හතක් ගමන් කර දකුණු අතේ දබරැඟිල්ල අහසට දිගු කර මෙසේ සිංහනාද පැවැත්තුවා.

"අග්ගෝ'හමස්මි ලෝකස්ස - ජෙට්ඨෝ'හමස්මි ලෝකස්ස
සෙට්ඨෝ'හමස්මි ලෝකස්ස - අයමන්තිමා ජාති නත්ථිදානි පුනබ්භවෝ"

**මම ලොවට අග්‍ර වෙමි, මම ලොවට ජ්‍යෙෂ්ඨ වෙමි, මම ලොවට ශ්‍රේෂ්ඨ වෙමි, මේ මගේ අන්තිම උපතයි. නැවත උපතක් නැත.**

සුදොවුන් රජුට කරුණු සැලවුණා. ඒ වන විට දෙව්දහ නුවර සිට එහි පැමිණි පෙරහැරත් සමග මහාමායා බිසව සහ පින්වත් කුමරු කිඹුල්වත් නුවර මාලිගයට ගෙන්වා ගැනීමට කටයුතු කළා.

දරුවනේ, අප මහා බෝසතාණන් වහන්සේගේ ඉපදීම සිදු වුණේ මේ විදියටයි. බෝසතුන් බිහි වූ ඒ වෙලාවේ මුළු ලෝකයට ම සතුටක්, සැනසිල්ලක්, නිදහසක් ඇති වුණා.



## සාරාංශය

- ★ සිදුහත් බෝසතාණෝ ආසන්න පෙර බවයෙහි තව්තිසා දෙව්ලොව දිව්‍ය පුත්‍රයෙකු වී සිටියහ.
- ★ බෝසත් දෙවියන්ට, මිනිස් ලොව උපදින්නට සහම්පති බ්‍රහ්මයා ඇතුළු දෙවියෝ ආරාධනා කළෝ ය.
- ★ පස්මහ බැලුම් යනු කාලය, දීපය, දේශය, කුලය හා මවු යන කරුණු විමසා බැලීමයි. එය **පංච මහා විලෝකනය** නමින් ද හැඳින්වෙයි.
- ★ බෝසතාණන් වහන්සේ මවු කුස පිළිසිඳ ගත්තේ ඇසළ පුන් පොහෝ දිනක ය.
- ★ බෝසත් කුමරු ඉපදුණේ ලුම්බිණි සල් උයනේ දී ය.
- ★ කුමාරෝත්පත්තිය සමග සිදු වූ අසිරිමත් සිදුවීම් රැසකි.
    1. සතර වරම් දෙවිවරු සාධුකාර පැවැත්වීම
    2. අහසින් සිසිල් හා උණුසුම් දිය දහරා මතුවීම
    3. සත් පියුම් මත වැඩි කුමරු සිංහනාද පැවැත්වීම

## ක්‍රියාකාරකම



01. ගැළපෙන පරිදි යා කරන්න.

| | |
|---|---|
| සිදුහත් බෝසතාණන් ආසන්න භවයේ සිටියේ | වෙසක් පසළොස්වක දා ය. |
| මනුලොව උපදින්නට ආරාධනා කළේ | තව්තිසා දෙව්ලොව ය. |
| මවුකුස පිළිසිඳ ගත්තේ | ඇසළ පොහොය දා ය. |
| බෝසත් කුමරු ඉපදුණේ | සහම්පතී මහා බ්‍රහ්මයා ප්‍රමුඛ දෙවියන් ය. |

## පැවරුම



දෙමාපියන් සමඟ විහාරස්ථානයට ගොස් ඔබ නැරඹූ, බෝසත් චරිතයට අදාළ සිතුවමක් චිත්‍රයට නඟන්න.

## පුහුණුවට

සහම්පති මහා බ්‍රහ්මයා තව්තිසා දෙව්ලොව දිව්‍යරාජයාට මනුලොව උපදින්නට ආරාධනා කළ ගාථාව

කාලෝ’යංතේ මහාවීර
උප්පජ්ජ මාතු කුච්ඡියං
සදේවකං තාරයන්තෝ
බුජ්ඣස්සු අමතං පදං

(මහා විරුවාණනි, මේ ඔබට මවු කුස ඉපදීමට කාලයයි. දෙවියන් සහිත ලෝක වාසීන් දුකින් මුදවමින් අමාරස ඇති නිවන අවබෝධ කරන්න.)